**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2017**

**-----------------------------------------**

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 55 දරන ජාතික මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2018 මැයි 01 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 79 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.75,914,655 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

2017 මැයි 02 දින රු.623,358 කට මිලදී ගත් රසායනාගාර උපකරණයක් සඳහා වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය රු.41,500 ක් වුවත්, රු.456,503 ක් ලෙස ගිණුම් තැබීම නිසා රු.415,003 ක් වැඩිපුර ක්ෂය කර තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.6,306,493 ක්වූ සැපයුම් හා සේවා සඳහා ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් හා වටිනාකම රු.24,915,351 ක්වූ ජංගම වත්කම් යටතේ දක්වා තිබූ රසායනාගාර උපකරණ, මෙවලම් හා ලී බඩු සම්බන්ධයෙන් භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

2013 මාර්තු 18 දින රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා පෞද්ගලික ආයතනයක් වෙත ගෙවන ලද රු. 55,863 ක් වූ අත්තිකාරම් මුදල ලබා දී වසර 05 කට අධික කාලයක් ගතවී ඇතත්, අදාළ භාණ්ඩ ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | සියලුම අතිරික්ත මුදල්, මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය මත ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, කෙටිකාලීන තැන්පතු හෝ වෙනත් ඵලදායී ආයෝජනයක යෙදවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් ආයෝජනය කර තිබුණු රු.6,000,000 ක් සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන තිබුණි . |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 101 | අස්ථානගතවී ඇති ලෙසට හඳුනා ගත් රු.1,212,717 ක් වටිනා කාර්යාලීය සහ රසායනාගාර උපකරණ 71 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438 | 2015 වර්ෂයේ දී භාවිතයෙන් ඉවත් කරන ලද රු.4,869,102 ක් වටිනා භාණ්ඩ 324 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.857,381,928 ක ස්ථාවර වත්කම්වලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.73,960,282 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.43,774,796 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,185,486 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව නඩත්තු හා ගිවිසුම්ගත සේවාවන් සඳහා වියදම රු.5,533,621 කින් හා ක්ෂයවීම් රු. 27,917,592 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.83,417,267 ක් වූ ආයතනයේ දායකය 2017 වර්ෂයේදී රු.124,020,032 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

#### 4.1.1 සැලසුම් කිරීම

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය පරිදි වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර, එම සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන, සෑම වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව ආයතනය සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, ආයතනයේ සමස්ත අරමුණු ඉටු කර ගැනීමට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර තිබුණේ ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු පමණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විද්‍යාත්මක පර්යේෂණ මඟින් නව සොයා ගැනීම් සඳහා පේටන්ට් බලපත්‍ර 4 ක් ලබා ගැනීමට ඉලක්ක කර තිබුණද, අයදුම්කර තිබුණේ එක් බලපත්‍රයක් සඳහා පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ කටයුතුවල නිරතව සිටින කාර්ය මණ්ඩලයේ විද්‍යාඥයින් 19 දෙනෙකු අතුරින්, විද්‍යාඥයින් 06 දෙනෙකු වෙත වර්ෂය තුළ රු.14,578,967 ක ද්‍රව්‍ය හා උපකරණ සපයා තිබුණද කිසිදු පර්යේෂණ කාර්යයක ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කළ සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ සමාලෝචන කමිටු රැස්වීම් වාර්තා 10 ට අනුව විද්‍යාඥයන්ගේ පර්යේෂණ ප්‍රගතිය පිළිබඳව සමාලෝචනය සිදු කර නොතිබුණි.

(ඈ) ආයතනය ආරම්භ කර වර්ෂ 30 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුණද, පර්යේෂණ ව්‍යාපෘති ඇගයීම සඳහා පොදුවේ පිළිගත් ක්‍රමවේදයන් හඳුන්වා දී නොතිබුණි. ආයතනයේ 2017 ජූනි 28 දින රැස් වූ පර්යේෂණ කවුන්සිලය මඟින් වාර්ෂික පර්යේෂණ ව්‍යාපෘති ඇගයීමේ ක්‍රියාවලින් නිර්මාණය කිරීම සඳහා තීරණයන් ගෙන තිබුණද, විගණන දිනය වූ 2018 ජනවාරි 16 දින වන විටත් එවැනි ක්‍රමවේදයන් හඳුන්වා දී නොතිබුණි. එසේම පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් වෙත අදාළ පර්යේෂණ කාර්යයන් පොදුවේ ලබා දී තිබූ අතර, ඒවා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට හෝ පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 පෙබරවාරි 16 වන දින රු.2,000,000 කට ප්‍රත්‍යාගණිත කළ කැබ් රථ 02 ක් වසරකට අධික කාලයක් භාවිතයෙන් ඉවත්කර තිබුණි. එය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශ ආයතනවලින් පුස්තකාල පොත්, රසායනාගාර ද්‍රව්‍ය හා වෙනත් උපකරණ මිලදී ගැනීම සඳහා 1998 වර්ෂයට පෙර අවස්ථා 04 කදී ලබා දී තිබූ එකතුව රු.57,918 ක අත්තිකාරම් මුදල අය කර ගැනීමට කටයුතු නොකර, පාලක මණ්ඩලයේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේ පොත්වලින් ලියා හැරීමට කටයුතු කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

ආයතනයේ භෝජනාගාරය පවත්වාගෙන යාමේ සේවාව ලබාදුන් කොන්ත්‍රාත්කරු සමග ආයතනය විසින් 2017 පෙබරවාරි 08 දින එළඹ තිබූ ගිවිසුමේ අංක 17 දරන වගන්තිය මඟින් අදාළ කොන්ත්‍රාත්කරු, ආයතනයට අයත් උපකරණ සඳහා රු.100,000 ක රක්ෂණාවරණයක් ලබා දිය යුතු බවට සඳහන් කර තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් අදාළ රක්ෂණාවරණය ලබා දී නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

ආයතනය සතු අක්කර 34.5 ක භූමි ප්‍රමාණයකින් යුතු දඹුල්ලේ පිහිටි "රුක් උයන" කළමනාකරණය සහ නඩත්තු කටයුතු වසර 20 ක කාලයක් සඳහා පෞද්ගලික සංවිධානයක් වෙත 2005 වර්ෂයේදී පවරා දී තිබුණි. ගිවිසුමට අදාළ කොන්දේසි එම සංවිධානය විසින් උල්ලංඝනය කරන බවට 2017 මැයි 25 වන දින අභ්‍යන්තර විගණනයේදී අනාවරණය වී තිබුණද, විගණිත දිනය වූ 2018 ජනවාරි 26 දින වන විටත් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග නොගෙන 2017 වර්ෂය තුළ රු.300,000 ක මුදලක් අදාළ සංවිධානය වෙත ගෙවා තිබුණි.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ආයතනය වෙත ලැබී තිබුණු රු.68,978,379 ක මුදලින් රු.48,507,290 ක් එනම් ප්‍රතිපාදිත මුදලින් සියයට 70 ක් උපයෝජනය කර නොතිබූ අතර, පසුගිය වර්ෂයට අදාළ ප්‍රතිපාදනවලින් සියයට 26 ක මුදලක්ද උපයෝජනය කර නොතිබුණි.

(ආ) ආයතනයේ සෑම මසකම අවසානයට රු.මිලියන 88 ත් රු.මිලියන 154 ත් අතර මුදල් ශේෂයක් පවත්වා ගෙන ගොස් තිබුණද එම මුදල් ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් හෝ ඵලදායි ආයෝජනයක යෙදවීමට හෝ කටයුතු කර නොතිබුණි.

**4.6** **හඳුනා ගන්නා ලද පාඩු**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 සහ 2016 වර්ෂයන්වලදී ආනයනය කළ එකතු වටිනාකම රු.14,053,353 ක් වූ උපකරණ 03 ක් නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් ප්‍රතික්ෂේප කිරීමට සිදුවීමෙන් තීරුබදු හා නිෂ්කාශන ගාස්තු ලෙස ගෙවූ රු.1,628,987 ක මුදලක් ආයතනයට අහිමි වී තිබුණි.

(ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව, අධ්‍යයන දීමනා ජීවන වියදම් දීමනාවක් ලෙස නිර්වචනය නොවන බැවින්, මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකත්වයට අදාළ කර නොගත යුතුය. එහෙත් එම විධිවිධානයට පටහැනිව 2013 ජනවාරි 08 දිනැති අංක 1000 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ උපදෙස් පරිදි ගෙවන ලද අධ්‍යයන දීමනාව මත පදනම්ව අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ඉහත අරමුදල්වලට ආයතනයේ දායකත්වය ලෙස රු.2,752,659 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඉකුත් වර්ෂවලදීද මේ පිළිබඳ පෙන්වා දී තිබුණද, එය නිවැරදි කිරීමට කටයුතු නොකර දිගින් දිගටම අරමුදල වෙත ප්‍රේෂණයන් කර තිබුණි.

**4.7** **කාර්ය මණ්ඩල පරිපාලනය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණිත දිනය වූ 2018 ජනවාරි 16 දිනට ආයතනයේ කාර්ය මණ්ඩල තනතුරු 04 ක පුරප්පාඩු 28 ක් පැවතුණි. පර්යේෂණ කටයුතු වෙනුවෙන් පිහිටුවා ඇති මෙම ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව තුළ නිලධාරීන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය වූ අතර, එය ආයතනයේ මූලික අරමුණ ළඟා කර ගැනීමට දැඩි බාධාවක්ව පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා වසර 03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීඑම්එස්/1608 හා 2014 මැයි 29 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී තිබුණද, එහි 03 ඡේදය ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

**4.8** **ආර්ථික නොවූ ගනුදෙනු**

**----------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා භෝජනාගාර සේවාව සැපයීම වෙනුවෙන් එළඹී ගිවිසුමෙහි ආයතනයේ ජලනළ වැද්දුම්කරණයට අදාළ පුද්ගලයකු සැපයිය යුතු බවට හා ඒ සඳහා මාසයකට රු.25,000 ක් ගෙවනු ලබන බවට කොන්දේසියක් ඇතුළත් කර තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය මත සුදුසු සේවා සැපයුම්කරුවෙකු අවම පිරිවැයක් යටතේ ලබා ගැනීමට සැලසුම් කිරීමකින් තොරව රු.300,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් කර තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට / පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව, ආයතනය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම, අත්පොතෙහි 4.2.1 වගන්තිය මඟින් හඳුන්වා දුන් ආකෘතිය අනුව ප්‍රසම්පාදනයන්ට අදාළ කාල රාමුව ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.25,870,610 ක් වූ ගිවිසුම්ගත සේවාවන් 05 ක් සහ රු.20,308,138 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ආයතනය සඳහා පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් සමග රු.2,200,000 ක මුදලකට 2016 මාර්තු 28 දින ගිවිසුමකට එළඹී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.7 වගන්තිය ප්‍රකාරව, තොරතුරු පද්ධතීන් ප්‍රසම්පාදනය කිරීමේ දී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් විශේෂ ලංසු කැඳවීමේ ලේඛන භාවිතා කර නොතිබුණි.

(ii) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2016 මාර්තු 28 දින රු. 660,000 ක් ගෙවීම් කර තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය ප්‍රකාරව, අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.

(iii) ගිවිසුම ප්‍රකාරව 2016 දෙසැම්බර් 27 වන විට අදාළ කාර්යය අවසන් කළයුතු වුවද, 2018 පෙබරවාරි වන විටත් එම කාර්යය අවසන් කර නොතිබුණි. නමුත් ගිවිසුමේ 25 ඡේදය ප්‍රකාරව, ප්‍රමාද ගාස්තු ලෙස අයකළ යුතු රු.220,000 ක මුදලක් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 (අ) වගන්තිය ප්‍රකාරව, ආයතනයේ ගිවිසුම්ගත සේවා ප්‍රසම්පාදනයේදී, ලියාපදිංචි තැපැල මඟින් ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදීම හේතුවෙන්, සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබා දීම යන අරමුණෙන් බැහැරව කටයුතු කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම මඟින් යෝජිත ව්‍යාපෘති සැලසුම් ප්‍රකාරව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ව්‍යාපෘති 03ක් මාස 06 සිට මාස 11 දක්වා කාලයක් ප්‍රමාද වී වැඩ ආරම්භ කර තිබුණි. ඒ අනුව පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම තාත්වික නොවන බවත්, එය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිත කර නොමැති බවත් නිරීක්ෂණය විය.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ඉදිකිරීම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් හෝ ඊට අනුකූලව මධ්‍යම පළාත් සභාව මඟින් අනුමත කරන ලද මිල ගණන් පාදක කර ගත යුතු වුවත්, ආයතනය රු.18,306,400 ක ඉදිකිරීම් ඇස්තමේන්තු ඊට අනුකූලව පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද ඇස්තමේන්තු මත පදනම්ව ඉංජිනේරුවරයාට රු.619,799 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

### 6.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම හා වියදම තත්‍ය ආදායම හා වියදම සමග සැසඳීමේදී විෂයයන් 06 ක සියයට 49 සිට සියයට 12,541 ක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. |
| (ආ) | සැලැසුම්කරණය | ආයතනයේ අරමුණු ඉටු කරගත හැකිවන පරිදි පර්යේෂණ කටයුතු සැලසුම්කර ක්‍රියාත්මක නොකිරීම. |
| (ඇ) | තොග පාලනය | සෙමින් චලනය වන තොග සහ නිෂ්ක්‍රීය තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම. |